# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011**
**2013 මැයි - අගෝස්තු**

**සමාජීය විද්‍යා පීඨය**

**සංචාරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය - TCRM - E 1015**

**සංචාරණය හා සංස්කෘතික සම්පත් පිළිබඳ හැඳින්වීම**

**<u>ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ නූතන ප්‍රවණතා සහ එහි වර්ධනයට එල්ල වී ඇති අභියෝග පිළිබඳව ප්‍රාමාණික විස්තරයක් කරන්න.

02. ත්‍රාසජනක සංචාරණය කුමක්ද යන්න හඳුන්වා, ශ්‍රී ලංකාවේ එම ව්‍යාපාරය ආරම්භ කිරීමට ඇති ශක්‍යතාවය පිළිබඳව සාකච්ඡා කරන්න.

03. රූ දෙස් සංචාරණය (eco tourism) සංකල්පය යනු කුමක්ද? රූ දෙස් සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේ දී ශ්‍රී ලංකාව මුහුණදෙන ප්‍රධාන අභියෝග පිළිබඳව සැකෙවින් දක්වන්න.

04. ශ්‍රී ලංකාවේ සංස්කෘතික සංචාරණය වර්ධනයට යුනෙස්කෝ ශ්‍රී ලංකා-මධ්‍යම සංස්කෘතික අරමුදලේ වැදගත්කම පැහැදිලි කරන්න.

05. සංචාරක මාර්ගෝපදේශකයන්ගේ වර්ගීකරණයක් සපයා, සංචාරක කර්මාන්තයේ අභිවෘද්ධියට ඔවුන්ගේ දායකත්වය පැහැදිලි කරන්න.

06. ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිත සංචාරණය ප්‍රවර්ධනය කිරීමේ දී මුහුණදීමට සිදුවන ප්‍රධානතම අභියෝග දක්වා, ඒවා මගහැරවා ගැනීමට යොදාගත හැකි උපායමාර්ග පිළිබඳව සාකච්ඡා කරන්න.

07. සංචාරක කර්මාන්තය හේතුවෙන් ශ්‍රී ලාංකීය සමාජයට සහ සංස්කෘතියට එල්ල වී ඇති බලපෑම පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න.

08. පහත සඳහන් මාතෘකාවලින් <u>දෙකක් (02)</u> පිළිබඳව ප්‍රමාණවත් විස්තර සපයන්න.

    1. ක්ෂුද්‍ර සංචාරක වෙළඳපල (niche market)
    11. සංචාරක සත්කාරක සේවා සංකල්පය
    111. ලෝක සංචාරක සංවිධානය (WTO)

***************************